**3 වන පිටුවෙන් (පරාජයේ)**

කියා සිටියේ වත්මන් ආණ්ඩුව තමාගේ එකක් නොවන නිසා දූෂණය මේ වන තෙක් පිටුදැකීමට අපහසු වූවත් මීළඟට පත්වන තමාගේම ආණ්ඩුවක දූෂණය සිදුකරන්නන්ට එරෙහිව පියවර ගන්නා බවය. ඒ පසුබිම මත රාජපක්ෂ ආණ්ඩුවේ ක්‍රියා පිළිවෙත මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන රටේ පාලන ක්‍රමය වහා වෙනස් විය යුතුය යනුවෙන් විශ්වාස කරන සුළුතරය වූවද ලක්ෂ හතළිස් ගණනක පිරිසක් සිටීම වැදගත් දෙයකි. ලක්ෂ හැටක පිරිසක් කවර අඩුපාඩු තිබියදී වූවද කවර වැරදි කළේ වූවද රාජපක්ෂ ආණ්ඩුව තවදුරටත් පවත්වාගත යුතුයැයි තීරණය කරද්දී ඉහත කී පිරිස මේ ජනාධිපතිවරණයේදී අත්හදා බැලූවේ ආණ්ඩුවේ ක්‍රියාපිළිවෙතට එරෙහිව පොදු න්‍යාය පත්‍රයක් තුළ කටයුතු කිරීමේ අසීරු උත්සාහයයි. ප්‍රතිපත්තිමය වශයෙන් අන්ත දෙකක සිටින ප්‍රායෝගික වශයෙන් එකිනෙකා දෙෂ ද්වේෂයෙන් ලබන ජනතා විමුක්ති පෙරමුණත්, එක්සත් ජාතික පක්ෂයත් එකම පෙරමුණක එකම වේදිකාවක සිටින තත්ත්වයක් ඇතිකරගත හැකි වූයේ මේ පොදු න්‍යාය පත්‍රය නිසාය. ආණ්ඩුව දිගින් දිගටම උත්සාහ කළේ මේ පාර්ශ්වයන් දෙක අතර වෛරය දිගින් දිගටම අවුළුවා තබමින් ඔවුන්ගේ ශක්තිය විසුරුවාලීමටය. එහෙත් ඒ කවර තත්ත්වයන් යටතේ වූවද බාහිරින් හා අභ්‍යන්තරයෙන්ම පැන නගින පසුබෑම්වලට අවසරයක් නොදී එක්ව කටයුතු කිරීමේ අසීරු උත්සාහය ජයගැනීම පිළිබඳව ඒජාපයටත්, ජවිපෙටත්, අනෙක් සුළුතර පක්ෂවලටත් ගෞරවය හිමි විය යුතුය. මහින්ද රාජපක්ෂ මහතා තමාට හා තම පවුලේ වුවමනාවන්ට අනුව පක්ෂය හසුරුවද්දී, සරත් ෆොන්සේකා මහතා පෙනී සිටියේ පොදු සම්මුතියක් තුළ කටයුතු කරන දේශපාලන මණ්ඩලයක නියෝජිතයකු වශයෙනි. එය එක්තරා ආකාරයකින් වන්දනාමාන කරන ඒකාධිපතියෙකු වෙනුවට බහුපාර්ශ්වික සම්මුතියකට කටයුතු කරන නියෝජිතයෙකුගේ ආකෘතිය සිහිකැඳවීය.

**දැන් වෙනසක් සඳහා වූ බලාපොරොත්තුව බිඳවැටී තිබේ. මෙවැනි මොහොතක කළකිරීම්ද, පසුබැසීම්ද බහුලය. පරාජය කෙරෙහි තමාගේ දායකත්වය තක්සේරු නොකොට අන් අය ඊට වගකිව යුතුය යන ජනප්‍රිය සිද්ධාන්ත පෙරමුණට පැමිණෙන්නේ මෙවැනි අවස්ථාවලදීය. එහෙත් එළැඹ ඇත්තේ පසුබැසීම් සඳහා සුදුසු අවස්ථාවක් නොවේ. රාජපක්ෂ රජය මේ මොහොතේ සුවිශාල සංකේතීය ජයග්‍රහණයක් වාර්තා කළද ඉදිරි වසර හයක කාලය තුළ ද මෙතෙක් සුපුරුදු ආකාරයෙන්ම පාලනය කළහොත් එය තමන් විසින් උපදවාගන්නා දේශපාලන අර්බුද ගණනාවකට මුහුණදීමට නියමිතය.ජනාධිපතිවරයා ජයග්‍රණය කළත්, ඔහුට එරෙහිව පැනනැගුණු චෝදනා දියවී යන්නේ නැත. එළැඹෙන ධූර කාලය තුළ යහපත් රාජ්‍ය පාලනයක් ගෙනයෑමට ඔහු උත්සාහ ගන්නා බව පෙන්වන්නට නම් පහත මඟහැර යා නොහැකි අභියෝගයන්ට පිළිතුරු දෙන්නට ඔහුට සිදුවෙයි. පළමුව ඔහු දෙමළ මිනිසුන්ට බලය බෙදීමේ වැඩපිළිවෙළකට මේ ධූර කාලය තුළ අනිවාර්යයෙන්ම යායුතුය. ඒ අතරතුර අවතැන් ජනයා නැවත ගම්බිම්වල පදිංචි කිරීම, එල්ටීටීඊ සැකකරුවන්ට සමාව ප්‍රදානය කිරීම හා පුනරුත්ථාපනය කිරීම උතුරේ අධිආරක්ෂිත කලාප ගැන නැවත සලකා බැලීම වැනි සංක්‍රමණීය ක්‍රියාමාර්ග ගැනීමටද ඔහුට සිදුවෙයි. සර්ව පාක්ෂික සමුළුවේ යෝජනාද කුණු කූඩයට දමා තිබෙන සහ මේ ජනාධිපතිවරණයේදී ද පැහැදිලිව පෙනුණු පරිදි දෙමළ ජනතාව මුළුමුනින්ම ජනාධිපතිවරයාගෙන් දේශපාලනමය වශයෙන් වෙන්ව සිටින තත්ත්වයක් යටතේ දෙමළ ජනතාවට පිළිගත හැකි දේශපාලන විසඳුමක් ලබාදීම සැබෑ අභියෝගයකි. අනෙක් අතට මේ ජනාධිපතිවරණය තුළ මහත් වූ වැඩකොටසක් ඉටු කළ විමල් වීරවංශ, චම්පික රණවක වැනි අන්ත ජාතිවාදී බලවේග නැවත ශක්තිමත්ව සිටීම එවැනි උත්සාහයකට තදබල බාධා පමුණුවයි. එහෙත් ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් නොදී ගැලවී ගන්නට දැක්විය හැකි කිසිම සාධාරණය හේතුපාඨයක් දැන් ජනාධිපතිවරයාට නැත.**දෙවනුව රාජපක්ෂ පාලනය තුළ මුල්බැස ගෙන තිබෙන ඥාති සංග්‍රහය හා දූෂණය පිටුදැකීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය. හුදු කටකතාය යන සීතාම්බර පටයෙන් වසා තිබුණත් රාජපක්ෂ පාලනය අන්ත දූෂිතයන්ගේ රජදහනක් බවට පොදු හැඟීමක් රටේ බහුතරයක් තුළ තිබේ. එය විද්ග්ධ තර්කවලින් වසාගත නොහැක්කකි. ඒ නිසා දූෂණ මැඩලීමමේ ශක්තිමත් යාන්ත්‍රණයක් ගොඩනැගීම්මේ අභියෝගයක් ඔහු ඉදිරියේ තිබේ. තමන් විසින් ස්ථානගත කරන ලද ගජමිතුරන් විසින් මහජන දේපල කෝටි ගණනින් අයථා ලෙස ගසාකෑම වළක්වන්නට ශක්තිමත් අධීක්ෂණය යාන්ත්‍රයක් ගොඩනැගීම ඔහු විසින් කළ යුතුය.

ඒ අතර රජයේ ප්‍රධාන තනතුරුවලට පමණක් නොව විදේශදූත මණ්ඩලවලටද කිසිම සුදුසුකමක් නොමැතිව පත්කොට තිබෙන අතිවිශාල පවුලේ ඥාතීන් හා හිතවතුන් පිරිස නැවත කැඳවාගැනීමට ඔහුට සිදුවන්නේය. විධායක ජනාධිපතිධූරය මුළුමනින්ම අහෝසි කරන්නට අකමැති වුවත් දැන් එයට එල්ලවී තිබෙන චෝදනා පහව යන කිසියම් හෝ ප්‍රතිසංස්කරණයකට යන්නටද ඔහුට සිදුවන්නේය. 17 වැනි ආණ්ඩක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය ජනාධිපතිවරයා විසින් තැවත ක්‍රියාත්මක කරනු ඇතැයි සිතිය නොහැකිය. එසේ වූවද රාජ්‍ය සේවය තුළ විසිර විහිද ඇති දේශපාලනීකරණය ඉවත් කරලීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන පෙන්වන්නට ඔහුට සිදුවෙයි. ජනාධිපතිවරයාගේ තනි අභිමතය මත කෙරෙන රාජ්‍ය සේවයේ ඉහළ පත්කිරීම් වෙනුවට කිසියම් සංවරණ හා තුලන ක්‍රමයක් ඉදිරියට ගෙන පෙන්වන්නටද ඔහුට සිදුවෙයි. පසුගිය කාලයේ සිදුවූ මාධ්‍යවේදී ඝාතන හා පැහැර ගැනීම්, පහරදීම් වැනි දේවලට වගකිව යුත්තේ කවුදැයි තමා දන්නා බවත් ඒ කාලයෙ හැටියට ඒ ගැන කිසියම් ආරක්ෂිත පිළිවෙතක් අනුගමනය කිරීමට තමන්ට සිදුවූ බවත් පුවත් පත්වලට ප්‍රකාශ කර ඇති ජනාධිපතිවරයාට දැන් ඒ අකටයුතුකම් ගැන සොයාන්නට කාලය පැමිණී තිබේ. ඒ අපරාදකරුවන් නීතිය ඉදිරියට ගෙන ආ යුතුය. එසේම මාධ්‍ය නිදහස හා අනෙක් මිනිස් අයිතිවාසිකම් නැවත වරක් ස්ථාපනය කරන්නට පියවර ගත යුතුය. ජාත්‍යන්තර සම්මුතීන් අනුගමනය නොකිරීම නිසා අහිමිව තිබෙන ජීඑස්පී ප්ලස් වැනි ආර්ථික ප්‍රයෝජන ලබාගැනීම සඳහාවත් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රඥප්තීන් ක්‍රියාත්මක කළයුතුය.

මේ ආදී වශයෙන් ජයග්‍රාහී ජනාධිපතිවරයා විසින් වහා විසඳුම් සෙවිය යුතු ප්‍රශ්න ගණනාවක් න්‍යාය පත්‍රයේ තිබේ. ඔහුට ඡන්දය දුන් කිසිවකු මේ කරුනු ගැන ඔහු ප්‍රමාණවත් මැදිහත්වීමක් කළ යුතු යැයි සිතන්නන් නොවන බව පැහැදිලිය. ඒ සියල්ලන් බලාපොරොත්තුව සිටින්නේ මේ දේවල් ගැන තනියෙන්ම සිතා බලා මහින්ද රාජපක්ෂ නැමැති යග පුරුෂයා විසින් දෙන දෙයක් ගෙන ඉන් සෑහීමට පත් වී සතුටු වන්නටය. එහෙත් දැනටත් ක්‍රියාත්මක වී තිබෙන ආකාරයට අනුව ජනාධිපතිවරයා සිය කැමැත්තෙන්ම මේ ප්‍රතිසංස්කරණවලට යාවියැයි සිතන්නට ඉඩක් කිසිසේත් ඇත්තේ නැත. ඒ සඳහා ඔහු යොමුකර ගැනීමට නම් ඊට බලපෑම් කරන ශක්තිමත් පොදුජන ව්‍යාපායක් අවශ්‍යය. ඒ පොදු ජන ව්‍යාපාරය ගොඩගැනීමේ කාර්ය භාරය පවරා ගත යුත්තේ මේ ජනාධිපතිවරණයේදී පරාජය ලැබූ බලවේග විසිනි. ඒ අර්ථයෙන් මේ පරාජයද ප්‍රතිපත්තිමය වශයෙන් මහා පොදු සාධකයක් තුළ එක්ව කටයුතු කරන්න, සටන් කරන එවැනි පොදුජන ව්‍යාපාරයක් මෙතෙක් රට තුළ ගොඩනගා ගැනීමට අසමත්වීමේ විපාකයක් ලෙස ස්වයං විවේචනාත්මකව භාරගැනීමට තරම් එම බලවේග නිහතමානී විය යුතුය.

පරාජය කළකිරීම් ගෙන දෙන්නේ වූවද පරාජයෙන් පසු කළයුතු දෑ වෙනුවෙන් එය ශක්තියද සපයයි. දැන් අවශ්‍ය වන්නේ පොදු ප්‍රජාතන්ත්‍රවාදී හා අයිතිවාසිකම් න්‍යාය පත්‍රයක් තුළ මෙතෙක් එක්ව කටයුතු කළ සියලු බලවේග කළකිරීමෙන් පසුබැස වෙන්ව විසිර යෑම නොව, තවදුරටත් එක්ව හිඳිමින් තමන්ට අතපසු වූ කාර්යයන් වෙතට බලාපොරොත්තු සහගතව එළැඹීමය.

(උපුටා ගැනීම රාවය පුවත්පතෙනි)

YSL
Migration Services

MIGRATION
SERVICES

We specialise in

Skilled Migration
State Sponsorship
Parent, Spouse and Student Visa

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956

0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805
Tel: 03 8794 9818 | 03 8794 9297 :Fax

yasho@yslmigration.com
www.yslmigration.com

Lead Design House

MIGRATION AGENT
REGISTERED
mara.com.au
REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF
MIGRATION INSTITUTE
— OF AUSTRALIA —